# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

අධ්‍යාපන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

## ආරක්ෂක සේවා පවත්වාගෙන යාම 2022/2023

01. සභාපති, ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, විසින් පහත කාර්යය සඳහා සුදුසුකම් සපුරා ඇති පිළිගත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| ප්‍රසම්පාදන අංකය | වැඩ විස්තරය | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු නොගෙවන මුදල (රු.) |
|---|---|---|---|
| 22/UVT/SUP/NCB/SS/01 | ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම | 150,000.00 | 2,500.00 |

02. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.

03. සුදුසුකම්ලත් අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා දුරකථන අංක - 011-2630733 මගින් සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්), වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇමතීමෙන් 2022 අගෝස්තු 23 වන දින සිට 2022 සැප්තැම්බර් මස 12 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 කාලය තුළ (සතියේ වැඩ කරන දිනයන්හි) විමසීම් සිදු කළ හැක.

04. අභිලාෂී ලංසුකරුවන්හට ලංසු ලිපි ලේඛණ කට්ටලයක් ආපසු නොගෙවනු ලබන ගාස්තු ගෙවීමෙන් (ආපසු නොගෙවනු ලබන ගාස්තු ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුව, රත්මලාන ශාඛාවේ ගිණුම් අංක 0070308457 ට බැර කළ යුතු අතර එම ලදු පතෙහි පිටපතක් ලංසුව සමග අමුණා එවිය යුතුය) හා සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්), වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2022 අගෝස්තු 23 වන දින සිට 2022 සැප්තැම්බර් මස 12 වන දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව. 2.00 දක්වා ලබාගත හැක.

05. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2022 අගෝස්තු මස 31 වන දින පෙ.ව. 10.00 ට සැපයුම් අංශයේදී සිදුකෙරේ.

06. අනුපිටපතකින් යුතු ලංසු (මුල් පිටපත හා අනු පිටපත) 2022 සැප්තැම්බර් මස 13 වන දින ප.ව. 2.00 ට පෙර විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයට ලැබෙනසේ "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල, රත්මලාන යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ විශ්වවිද්‍යාලීය සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළ තැන්පත් කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි "ප්‍රසම්පාදන අංකය, ප්‍රසම්පාදනයේ විස්තර, ලංසුපත් විවෘත කිරීමේ දිනය" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2022 සැප්තැම්බර් මස 13 වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ අධිකාරී බලයලත් නියෝජිතයෙකුට (බලය පවරන ලද ලිපිය සමඟ) සහභාගි විය හැක.

08. ඕනෑම අවස්ථාවක ඇති එක් ලංසුවක් හෝ ලංසු කිහිපයක් හෝ ලංසු සියල්ල භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සියලු හිමිකම් විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව සතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,**
**අංක 100, කඳවල,**
**රත්මලාන.**

Tel: 0112630733
Fax: 0112630738
Web: www.uovt.ac.lk

**2022 අගෝස්තු 23 දින.**